

# පළාත් ආදායම් දෙපාර්තමේන්තුව

## මධ්‍යම පළාත

# කාර්යය සාධන වාර්තාව 2021



**“ගෙවන බද්ද මැද රටේ සංවර්ධනයටයි”**

**පළාත් ආදායම් දෙපාර්තමේන්තුව**
අංක 244, කටුගස්තොට පාර, මහනුවර.

දු.ක. : 0812213022
ෆැක්ස් : 0812213033
ඊමේල් : info@revenue.cp.gov.lk
cpcrevenue@gmail.com
වෙබ් අඩවිය : revenue.cp.gov.lk

# පළාත් ආදායම් දෙපාර්තමේන්තුව (මධ්‍යම පළාත)

## 1. හැඳින්වීම

### 1.1. දැක්ම

මධ්‍යම පළාතේ ආදායම් වර්ධනයට ඉහළම දායකත්වයක්

### 1.2. මෙහෙවර

ව්‍යවස්ථාපිත ආදායම් මූලාශ්‍ර තුලින් ආදායම් රැස්කිරීමත්, බදු හා ගාස්තු ගෙවිය යුතු පුද්ගලයන් සම්බන්ධයෙන් තොරතුරු ලබා ගැනීමත්, ඒ සම්බන්ධයෙන් විනිවිදභාවයෙන්, සමානාත්මතාවයෙන් හා සාධාරණව කටයුතු කිරීමෙන්, මධ්‍යම පළාතේ ආදායම වැඩි දියුණු කිරීම මගින් පළාත් වාසීන්ගේ ජීවන තත්ත්වය ඉහළ නැංවීම.

### 1.3. අරමුණු හා කාර්යයන්

**අ)** ආදායම් ඉලක්ක සපුරා ගැනීම

1. 2021 වර්ෂයේ දී මුද්දර ගාස්තු ආදායම ලෙස රුපියල් මිලියන 1600 ක් එකතු කිරීම
2. පවතින හිඟ පිරිවැටුම් බදු වලින් රුපියල් මිලියන 0.2ක් එකතු කිරීම
3. ඛනිජ අයිතීන් පිළිබඳ බද්ද රුපියල් මිලියන 3.5ක් එකතු කිරීම
4. බඩු උකස් ගන්නන්ගේ ප්‍රඥප්තිය යටතේ ආදායම් රැස්කිරීම

**ආ)** නව ආදායම් උත්පාදන ක්‍රම සොයා ගැනීම හා අනුමත කර ගැනීම.

**ඇ)** වෘත්තීය නිපුණතාවය දියුණු කිරීම

**ඈ)** තොරතුරු තාක්‍ෂණයේ සංවර්ධනය

**ඉ)** තෙවන පාර්ශවයන් දැනුවත් කිරීම

**ඊ)** යහපාලනය

## 1.4. මධ්‍යම පළාත් ආදායම් දෙපාර්තමේන්තුව ගැන

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවට ගෙන එන ලද දහතුන්වන සංශෝධනය මඟින් පළාත් සභාව නම් වූ පරිපාලන ඒකකය ආරම්භ වූ අතර, මෙම පළාත් සභාවන් හී ආදායම් කටයුතු සම්බන්ධ කාර්යභාරයන් පළාත් ආදායම් දෙපාර්තමේන්තුව වෙත පැවරී ඇත. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ නව වන උපලේඛනයේ පළාත් සභා ලැයිස්තුවේ 36 වන වගන්තිය යටතේ 36:1 සිට 36:20 දක්වා ඇති උප වගන්ති මගින් පළාත් සභාවන්ට අදාල වූ ආදායම් ප්‍රභවයන් හඳුන්වා දී ඇත. ඉහත නෛතික විධිවිධානයන්ට අනුකූලව මධ්‍යම පළාතේ පළාත් සභාව විසින් සම්මත කර ගන්නට යෙදුණු 1990 අංක 17 දරණ මුදල් ප්‍රඥප්තියේ නෛතික රාමුව තුළ පළාත් ආදායම් දෙපාර්තමේන්තුව ස්ථාපිත කර ඇත.


ඉහත කී මුදල් ප්‍රඥප්තිය මගින් හා 1996 අංක 03 දරණ මධ්‍යම පළාත් මුදල් (පරිපූරක විධිවිධාන) ප්‍රඥප්තිය යන ප්‍රඥප්ති මගින් පළාත් ආදායම් කොමසාරිස්වරයාගේ සෘජු පරිපාලනයට යටත්ව බදු හා ගාස්තු මෙන්ම පළාත් ආදායම් කොමසාරිස්වරයාගේ අධීක්ෂණය යටතේ ක්‍රියාත්මක විය යුතු බදු හා ගාස්තු වර්ග දක්වමින් පළාත් ආදායම් දෙපාර්තමේන්තුවේ විෂය පථය හඳුන්වා දී ඇත. පහත සඳහන් ආදායම් ශීර්ෂ මෙම ප්‍රඥප්ති මගින් දක්වා ඇත.

- පිරිවැටුම් බද්ද
- මුද්දර ගාස්තුව
- ඔට්ටු බද්ද
- ඛනිජ අයිතීන් පිළිබඳ බද්ද
- මෝටර් ප්‍රවාහන පනත යටතේ ගාස්තු දණ්ඩන හා බලපත්‍ර ගාස්තු
- අධිකරණ දඩ හා ගාස්තු
- මධ්‍යම පළාත් ලොතරැයි පිළිබඳ බදු
- ඉඩම් හා ගොඩනැගිලි බද්ද
- ඉඩම් සංවර්ධන ආඥාපනත යටතේ ඉඩම් සඳහා ගාස්තු
- සුරාබදු ආදායම
- වන සත්ත්ව හා වෘක්ෂලතා ආරක්ෂක ආඥාපනත යටතේ වූ ගාස්තු
- පඩි හා මිමි ආඥාපනත යටතේ ගාස්තු
- තෑගි තරග බද්ද

වර්තමානයේ පළාත් ආදායම් කොමසාරිස්වරයාගේ සෘජු පරිපාලනය යටතේ ක්‍රියාත්මක වන බදු හා ගාස්තු

1. පිරිවැටුම් බද්ද -1991 සිට 2010 (4) කාර්තුව දක්වා වූ හිඟ පිරිවැටුම් බදු පමණි.
2. මුද්දර ගාස්තු - 1991 සිට ක්‍රියාත්මක වේ.
3. ඛණිජ අයිතීන් පිළිබඳ බද්ද - 2014 (2) කාර්තුවේ සිට ක්‍රියාත්මක වේ.
4. බඩු උකස් ගන්නන්ගේ ප්‍රඥප්තිය යටතේ ගාස්තු - 2015 නොවැම්බර් සිට ක්‍රියාත්මක වේ.

**1.5.**



## 1.6. කාර්ය මණ්ඩල තොරතුරු

2021-12-31 දිනට දෙපාර්තමේන්තුවේ අනුමත තනතුරු සංඛ්‍යාව හා සටින සංඛ්‍යාව

| තනතුර | අනුමත සංඛ්‍යාව | වැ. කේ. | සිටින සංඛ්‍යාව | සෘජු බඳවා ගැනීමේ අවම සුදුසුකම් |
|---|---|---|---|---|
| ආදායම් කොමසාරිස් | 1 | SL-1 | 1 | |
| නියෝජ්‍ය ආදායම් කොමසාරිස් | 1 | SL-1 | 1 | |
| තක්සේරුකරු | 14 | SL-1 | 13 | පිළිගත් විශ්ව විද්‍යාලයක පළමු හෝ 2වන පන්තියේ උපාධියක් / වරලත් හෝ එකාබද්ධ ගණකාධිකාරීන් |
| බදු නිලධාරී | 22 | MN-5 | 18 | පිළිගත් විශ්ව විද්‍යාලයක උපාධියක්, / වරලත් ගණකාධිකාර ආවසරික2/ CIMA 3වන මට්ටම |
| සංවර්ධන නිලධාරි | 12 | MN-4 | 12 | |
| රා.කළමනාකරණ සහකාර | 6 | MN-2 | 6 | |
| රියදුරු | 3 | PL-III | 3 | |
| කාර්යාල කාර්ය සහායක | 4 | PL-I | 4 | |
| | | | | |
| **එකතුව** | **63** | | **58** | |

ඉහත සටහනේ දැක්වෙන පුරප්පාඩු තනතුරු වලට නිලධාරීන් බඳවා ගැනීමට කටයුතු කරන මෙන් පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව වෙත ඉල්ලීම් කර ඇති අතර මෙතෙක් බඳවාගැනීම් සිදුකර නැත.

## 2. 2021 වර්ෂයේ සැලසුම් කරන ලද කාර්යයන් හා ඉටුකළ කාර්යයන්

### 2021 වර්ෂය තුළදී අරමුණු කරා ළඟාවීමේ ප්‍රගතිය


| ආදායම් ප්‍රභවය | | වාර්ෂික ආදායම් ඉලක්කය රුපියල් | 2021 වර්ෂය තත්‍ය ආදායම රුපියල් | ළඟා වීමේ ප්‍රගතිය |
|---|---|---|---|---|
| 01 | මුද්දර ගාස්තු<br>අයවැයෙන් ලබා දුන් ඉලක්කය<br>දෙපාර්තමේන්තු ක්‍රියාකාරී සැලැස්ම අනුව ඉලක්කය | 2,250,000,000<br>1,600,000,000 | 2,086,849,906<br>2,086,849,906 | **93%**<br>**130%** |
| 02 | හිග පිරිවැටුම් බදු | 200,000 | 1,239,000* | **620%** |
| 03 | බනිජ අයිතීන් පිළිබඳ බද්ද<br>අයවැයෙන් ලබා දුන් ඉලක්කය<br>දෙපාර්තමේන්තු ක්‍රියාකාරී සැලැස්ම අනුව ඉලක්කය | 5,000,000<br>3,500,000 | 3,645,036<br>3,645,036 | **73%**<br>**104%** |
| 04 | බඩු උකස් ගන්නන්ගේ ප්‍රඥප්තිය<br>• බලපත්‍ර ගාස්තු හා ලියාපදිංචි ගාස්තු<br>අයවැයෙන් ලබා දුන් ඉලක්කය<br>දෙපාර්තමේන්තු ක්‍රියාකාරී සැලැස්ම අනුව ඉලක්කය | 6,000,000<br>2,800,000 | 4,674,000<br>4,674,000 | **78%**<br>**167%** |
| 05 | වෙනත් ආදායම්<br>මත ලබාදීමේදී අය කරන ගාස්තු | - | 239,100 | |
| | **එකතුව**<br>අයවැයෙන් ලබා දුන් ඉලක්කය<br>දෙපාර්තමේන්තු ක්‍රියාකාරී සැලැස්ම අනුව ඉලක්කය | 2,261,000,000<br>1,606,500,000 | 2,096,647,042<br>2,096,647,042 | **93%**<br>**130%** |

* මධ්‍යම පළාත් සභාවේ 2021 අය වැය ඇස්තමේන්තුවෙන් පිරිවැටුම් බද්ද සඳහා ඉලක්කයක් ලබා දී නොතිබූ අතර හිග පිරිවැටුම් බද්දක් වෙනුවෙන් පනවා තිබූ නඩු තීන්දුවකට අනුව වාරික ලෙස ගෙවන බද්දක් හේතුවෙන් මෙම මුදල ලැබී ඇත.

## 2021 වර්ෂයේ ඉටුකළ කාර්යයන්


### අ) 2021 වර්ෂයේ දී මුද්දර ගාස්තු ආදායම ලෙස රුපියල් මිලියන 2,086 ක් එකතු කිරීම

කොවිඩ්19 ගෝලීය වසංගතයේ යම් පාලනයක් සමග 2021 වසර ආරම්භ වුව ද එම වසරේ සිංහල හා හින්දු අළුත් අවුරුදු සමයෙන් පසුව ද නැවත කොවිඩ්19 ඩෙල්ටා ප්‍රභේදයේ සීඝ්‍ර ව්‍යාප්තියත් සමග ඇති වූ තත්වය හමුවේ රට වරින් වර වසා දැමීමට සිදුවීම, දැඩි සංචරණ සීමා පැනවීම ආදී කාරණා හේතුවෙන් ආදායම් ඉපැයීමේ ක්‍රියාවලිය ද දැඩි බලපෑමට ලක්විය. වසංගතයේ බලපෑම ආදායම් රැස්කිරීමේ ක්‍රියාවලියට සෘජුව බලපා ඇති ආකාරය, 2021 වසරේ මාසිකව දෙපාර්තමේන්තුව රැස්කල මුද්දර ගාස්තු ආදායම දැක්වෙන 2.1 රූපසටහනෙන් මනාව පැහැදිලි වේ.




**රූප සටහන 2.1:** 2021 වර්ෂයේ මාසිකව රැස්කල මුද්දර ගාස්තු ආදායම

කොවිඩ්19 වසංගතය නිසා රටේ ආර්ථිකයේ සිදුවූ බලපෑම මත මහජනතාවට පීඩාවක් ඇති නොවන අයුරින් ආදායම් ඉලක්ක සපුරා ගැනීම විශාල අභියෝගයක් වූ අතර එම අභියෝගයට සාර්ථකව මුහුණ දෙමින් පළාත් සභාවේ 2021 අය වැය ඇස්තමේන්තුවෙන් පළාත් ආදායම් දෙපාර්තමේන්තුවට ලබා දුන් ආදායම් ඉලක්කය වූ රුපියල් මිලියන 2250 ක ඉලක්කය 93%කින් සපුරා ගනිමින් රු. 2,086,849,906.00ක් රැස්කරගැනීමට හැකිවීම දෙපාර්තමේන්තුව ලද ජයග්‍රහණයකි. 2021 පළමු අර්ධ වර්ෂයේ එකතු කල මුද්දර ගාස්තු ආදායම වූ රු. මිලියන 887 ට සාපේක්ෂව දෙවන අර්ධ වර්ෂය තුල 35%ක වර්ධනයක් සමග රු. මිලියන 1200ක ආදායමක් රැස්කරගත හැකි වීම ද විශේෂත්වයකි. **(රූප සටහන 2.2)**




**රූප සටහන 2.2:** 2021 පළමු හා දෙවන අර්ධ වර්ෂවල මුද්දර ගාස්තු ආදායම

පවත්නා නිරෝධායන නීති යටතේ බදුගෙවන්නන් සම්මුඛ සාකච්ඡා කැඳවීම, දේපල ස්ථාන සමීක්ෂණය කිරීම, නීතිමය ක්‍රියාමාර්ග ගැනීම ආදී රාජකාරි කටයුතු දැඩි ලෙස සීමා කිරීම් මධ්‍යයේ වුවද මනා සැලසුමකින් යුක්තව රාජකාරි කටයුතු සංවිධානය කරමින් මාර්ග ගත ක්‍රමය තුලින් හා නිවසේ සිට රාජකාරි කිරීමේ ක්‍රියාවලිය මගින් ඉහත ඉලක්කයට ළඟාවීමට හැකිවූ අතර මේ සඳහා නිලධාරීන්ගේ දැඩි කැපවීම ද මහත් පිටිවහලක් විය. 2021 වසර තුල නිලධාරීන්ගේ සෘජු මැදිහත්වීම මත එකතුකරන ලද අතිරේක මුද්දර ගාස්තු ප්‍රමාණය රු. 79,959,869.00කි. මෙය පසුගිය වසරට සාපේක්ෂව 33%ක වර්ධනයකි.

### ආ) පවතින හිඟ පිරිවැටුම් බදු වලින් රුපියල් මිලියන 1.2ක් එකතු කිරීම

මධ්‍යම රජයේ ප්‍රතිපත්තිමය තීරණයක් අනුව 2011 අයවැය යෝජනා මගින් පිරිවැටුම් බද්ද අත්හිටුවීම නිසා වර්තමානයේ පිරිවැටුම් බදු ලෙස 2010-12-31 දක්වා වන හිඟ හිටි බදු පමණක් අයකර ගැනීම කරන අතර පිරිවැටුම් බදු පැනවීමක් සිදු නොවේ. මධ්‍යම පළාත් සභාවේ 2021 අය වැය ඇස්තමේන්තුවේ පිරිවැටුම් බද්ද ඇස්තමේන්තු කර නැතත් හිඟ බද්ද ලෙස රු. මිලියන 0.2ක් එකතු කිරීමට දෙපාර්තමේන්තු සැලැස්මේ දක්වා ඇත.

කෙසේ වුවද හිඟ පිරිවැටුම් බද්දක් වෙනුවෙන් පනවා තිබූ නඩු තීන්දුවකට අනුව වාරික ලෙස ගෙවන බද්දක් හේතුවෙන් 2021 වසරේ රු. 1,239,000.00ක හිඟ පිරිවැටුම් බදු ආදායමක් රැස්කර ගැනීමට හැකියාව ලැබී ඇත.

### ඇ) ඛනිජ අයිතීන් පිළිබඳ බද්ද රුපියල් මිලියන 3.6ක් එකතු කිරීම

2021 වර්ෂයේ ඉලක්කගත ඛනිජ අයිතීන් පිළිබඳ බදු ආදායම වන රු.5,000,000/- ක් වුවද රැස්කරගත හැකිවූ ඛනිජ බදු ආදායම රු. 3,645,036/-කි. කොවිඩ් වසංගතය හමුවේ වරින් වර රට වසා දැමීම නිසා ව්‍යාපාරික කටයුතු අඩාල වීමත්, රටේ සංවර්ධන කටයුතු වල පැවති මන්දගාමී ස්වභාවය, ඛනිජ කැනීමේ දැඩි සීමා පැනවීමත්, ඛනිජ ද්‍රව්‍ය කැනීමේ බලපත්‍ර නිකුත් කිරීමේ ස්වභාවය අනුව වසර පුරා අඛණ්ඩව ව්‍යාපාර කටයුතු සිදු නොවීමත්, කාලගුණ විපර්යාස වල දැඩි බලපෑමත් යන කාරණා මත ඛනිජ බදු ආදායම ද අපේක්ෂිත ඉලක්කය කරා ළඟාවීමට නොහැකි වී ඇත.

### ඈ) බඩු උකස් ගන්නන්ගේ ප්‍රඥප්තිය යටතේ ආදායම්

මේ යටතේ දෙපාර්තමේන්තු ඉලක්කය වූ රු. 2,800,000/- අභිබවා 66%ක වර්ධනයක් සමග රු. 4,674,000/-ක බලපත්‍ර හා ලියාපදිංචි ගාස්තුවක් එකතු කිරීමට දෙපාර්තමේන්තුවට හැකි විය. ලෝක රන් මිල වැඩිවීමත්, රජයේ ප්‍රතිපත්තිමය තීරණ මත ණය පොලී අනුපාත අඩුකිරීම හා ආර්ථික ගැටළු හේතුකොටගෙන රන් භාණ්ඩ උකස් කිරීම් වැඩිවීමත් යන කරුණු නිසා බඩු උකස්ගන්නා ව්‍යාපාර වල යම් පිබිදීමක් සිදුව ඇති අතර අළුතෙන් ව්‍යාපාර ඇරඹීමේ ප්‍රවණතාවයක් ද දක්නට ලැබේ. මේනිසා ඉදිරි කාලයේදී වාර්ෂික බලපත්‍ර ගාස්තු වල වර්ධනයක් අපේක්ෂා කල හැකිය.

### ඉ) නව ආදායම් උත්පාදන ක්‍රම සොයා ගැනීම හා අනුමත කර ගැනීම.

පහත සඳහන් යෝජනා මේ වන විට ඉදිරිපත් කර ඇති අතර,මෙතෙක් අනුමත වී නොමැත.

1. ඖෂධ හා රසායන වෙළඳ බලපත්‍ර බදු ප්‍රඥප්තිය
2. මෝටර් රථවාහනයක අයිතිය පැවරීමේ මුද්දර ගාස්තුව
3. කාර්තුවක පිරිවැටුම රු.මිලියන 30 ට අඩු ව්‍යාපාර සඳහා පිරිවැටුම් බද්ද

### ඊ) වෘත්තීය නිපුණතාවය දියුණු කිරීම

- 2021 වර්ෂය තුළ දී නිරෝධායන නීති යටතේ පිරිස් එක්රැස්වීම් සීමාකර තිබීම හේතුවෙන් පුහුණු වැඩමුළු පැවැත්වීම ද සීමා කිරීමට සිදු වූ අතර දෙපාර්තමේන්තුවේ නිලධාරීන් සඳහා, රාජකාරී කටයුතුවලදී පරිගණක දත්ත පද්ධතියේ ප්‍රායෝගික භාවිතය පිළිබඳ දැනුවත් කිරීමේ වැඩසටහනක් පවත්වන ලදී.

## උ) තොරතුරු තාක්ෂණයේ සංවර්ධනය

- Web-based පරිගණක වැඩසටහනක් හා E-file Management System එකක් සෑදීමේ කටයුතු අවසන් කර ක්‍රියාවට නංවා ඇත.

## ඌ) තෙවන පාර්ශවයන් දැනුවත් කිරීම

- නව Web-based පරිගණක වැඩසටහනට ගැලපෙන සේ දෙපාර්තමේන්තුවේ නිල වෙබ් අඩවිය නවීකරණය කර යාවත්කාලීනව පවත්වාගෙන යාමෙන් ආකෘති පත්‍ර හා දැන්වීම් මඟින් බදු ගෙවන ජනතාව දැනුවත් කිරීමටත් අවශ්‍ය ආකෘති පත්‍ර බාගත කරගැනීමටත් අවශ්‍ය පහසුකම් ලබාදීමට කටයුතු කර ඇත.

**<u>2021 ක්‍රියාකාරී සැලැස්ම සැලසුම අනුව කාර්ය සාධනය</u>**

| අරමුණ | අංශය | කාර්යයන් | ඉලක්කය | ළඟාවීම |
|---|---|---|---|---|
| 1. ආදායම් ඉලක්ක සපුරා ගැනීම | මුද්දර අංශය රු.මිලි.1600 | **ආදායම රු.මිලියන** | **1,600** | **2,086** |
| | | 1. ඉඩම් රෙජිස්ට්‍රාර් කාර්යාල වලින් සෘජුව ලැබෙන තොරතුරු අංශ අනුව බෙදාහැරීම<br>2. අදාල කාර්යාලවලට ගොස් තොරතුරු රැස්කිරිම හා බැංකු මගින් ලැබෙන තොරතුරු<br>3. මෙම ලබාගත් තොරතුරු අදාල අංශ අනුව බෙදා හැරිම | 26000 | 34187 |
| | | 4. තොරතුරු ලේඛනයට අනුව ගොනු ආරම්භ කිරිම | 8500 | 11776 |
| | | 5. ගොනු සඳහා සාධන පත්‍ර කැඳවීම. | 8500 | 11776 |
| | | 6. ගොනු විශ්ලේෂණය කිරිම.(ආකෘති පත්‍ර 300,101 හා 190 මගින්) | 9000 | 8579 |
| | | 7. සාධන පත්‍ර නොලැබුණු ගොනු හඳුනා ගැනීම. | | |
| | | 8. i. ගෙවූ ගාස්තු ප්‍රමාණවත් නම් ගොනුව අවලංගු කිරිම. | | 5140 |
| | | ii. මතය ලබා දීමේදී සහ ගෙවීම් ප්‍රමාණාත්මක නොවන්නේ නම් සම්මුඛ සාකච්ඡා කැඳවා අතිරේක මුද්දර ගාස්තු තීරණය කිරිම හෝ එකතු නොවනවිට ස්ථාන පරීක්ෂණ සිදුකර හෝ අතිරේක මුද්දර ගාස්තු තීරණය කිරීම | රු.මිලි.60 | රු.මිලි.79.9 |
| | | iii. දේපල තක්සේරු කිරීමේ කාර්යය සඳහා සිදුකිරීමට අපේක්ෂිත ස්ථාන පරීක්ෂණ සංඛ්‍යාව. | 200 | 43 |
| | | iv. සම්මුඛ සාකච්ඡා සඳහා කැඳවීම් ගොනු සංඛ්‍යාව | 2500 | 3414 |
| | | 9. තක්සේරු දැන්වීම් නිකුත් කිරිම සහ තක්සේරු සහතික (මත) නිකුත් කිරිම | 1000 | 950 |
| | | 10. අභියාචනා /විරෝධතා විසඳීම.(ලැබෙන සියල්ල) | | |
| | | 11. තක්සේරු දැන්වීම මත ගෙවා නොමැති නම් නීතිමය පියවර ගැනීම | 30 | 14 |
| | | 12. තොරතුරු නොසැපයීම මත ගෙවා නොමැති නම් නීතිමය පියවර ගැනීම | 75 | 94 |
| | ඛනිජ අයිතීන් පිළිබඳ බදු අංශය රු.මිලි. 3.5 | **ආදායම රු.මිලියන** | **3.5** | **3.6** |
| | | 1. ඛනිජ බදු වාර්තා නිකුත් කිරිම | 4000 | 3831 |
| | | 2. වාර්තා පරීක්ෂා කර ස්වතක්/නිදහස් ලකුණු කිරිම | 2000 | 775 |
| | | 3. ලිපිගොනු ආවේක්ෂණය කිරිම | 1500 | 1574 |
| | | 4. තක්සේරු දැන්වීම් හෝ අතිරේක තක්සේරු නිකුත් කිරිම | 20 | 22 |
| | | 5.ඛනිජ බදු ගෙවීම්පත් දත්ත පරිගණක ගත කිරීම | සියල්ලම | සියල්ලම |
| | | 6. වාර්තා නොසැපයීම මත ගෙවා නොමැති නම් නීතිමය පියවර ගැනීම | 25 | 6 |
| | බඩු උකස් ගන්නන්ගේ ප්‍රඥප්තිය - ගාස්තු හා තැන්පතු රු.මිලි. 2.8 | 1. වාර්ෂික බලපත්‍ර ගාස්තු | **රු.මිලි. 2.8** | **රු.මිලි.4.65** |

| | | | | |
|---|---|---|---|---|
| | අය හා හිඟ බදු අංශය<br><br>හිඟ පිරිවැටුම් රු.මිලි. 0.2 | 1. අභියාචනා /විරෝධතා විසඳීම<br>ඉදිරිපත් කර ඇති සියලුම අභියාචනා විසඳා අවසන් කිරීම<br>2. පැහැර හැරි තැනැත්තන්ගේ ස්ථානවලට ගොස් හිඟ බදු/ ගාස්තු එකතු කිරීම (D 7)<br>3. නොගෙවූ හා එකගතාවයකට නොපැමිණෙන අය වෙනුවෙන් නීතිමය පියවර ගැනීම.<br>4. ගෙවීම් පත්වල දත්ත පරිගණක ගත කිරීම<br>5. අගරු චෙක්පත් පිළිබඳව ප්‍රමාදයකින් තොරව කටයුතු කිරීම | සියල්ලම<br><br>200<br><br>සියල්ලම | ෂියල්ලම<br><br>196<br><br>2<br>සියල්ලම |
| | තෙවන පාර්ශ්වයන් දැනුවත් කිරීම | 1. අදාළ ස්ථානවල ප්‍රදර්ශනය සඳහා දැන්වීම් සකස් කිරීම හා ප්‍රදර්ශනය කරවීමට සැලැස්වීම<br>2. පුවත්පත් දැන්වීම් පල කිරීම<br>3. දැනුවත් කිරීමේ වැඩමුළු පැවැත්වීම<br>4. වෙබ් අඩවිය යාවත්කාලීනව පවත්වාගෙන යාම | | දැනුවත් කිරීමේ දැන්වීම් පුවරු සකස් කර ප්‍රදර්ශනය කර ඇත |
| 2. නව ආදායම් උත්පාදන ක්‍රම සොයා ගැනීම හා අනුමත කර ගැනීම. | | 1. නීති අධ්‍යයනය කිරීම හා පවතින ප්‍රභවයන් මොනවාදැයි අධ්‍යයනය කිරීම.<br>2. එම ප්‍රභවයන් පිළිබඳ සබ්‍යතා අධ්‍යයනයන් සිදු කිරීම.<br>3. ක්‍රියාත්මක කිරීමට, වඩා සුදුසු ආදායම් ප්‍රභවයන් තීරණය කිරීම.<br>4. හඳුනාගත් නව ආදායම් උත්පාදන ක්‍රම යෝජනා අනුමැතිය සඳහා ප්‍රධාන ලේකම් වෙත ඉදිරිපත් කිරීම<br>5. ක්‍රියාත්මක කිරීම | 1 | දැනටමත් ඉදිරිපත් කර ඇත |
| 3. ධාරිතා සංවර්ධනය | කාර්ය මණ්ඩල පුහුණුව හා සංවර්ධනය | 1. වෘත්තීය පුහුණු අවශ්‍යතා ක්ෂේත්‍රයන් හඳුනාගැනීම<br>2. පාඨමාලා ක්‍රමවේදයක් සකස් කිරීම.<br>3. සම්පත් දායක පුද්ගලයන් සහ ආයතන හඳුනාගැනීම.<br>4. පිරිවැය හඳුනාගැනීම. | | නිලධාරීන් පුහුණු කිරීමේ වැඩසටහනක් පවත්වන ලදී |
| | තොරතුරු තාක්ෂණයේ සංවර්ධනය | 1. කාර්යක්ෂම, ආරක්ෂාකාරී තොරතුරු පද්ධතියක් සැකසීම<br>2. කාලීන අවශ්‍යතා අනුව යාවත්කාලීන කිරීම<br>3. Web Base පරිගණක වැඩසටහනක් සැකසීම | | ක්‍රියාවට නංවා ඇත |
| 4. යහපාලනය | | 1. ආයතනයේ කාර්යසාධන මට්ටම ඉහළ නැංවීම<br>2. රාජ්‍ය නීතිරීති හා රෙගුලාසි වලට අනුකූලව ක්‍රියාත්මක කිරීම<br>3. පැමිණිලිවලින් තොර වූ ආයතනයක් ඇති කිරීම | | සාර්ථක මට්ටමේ පවතී |

ඉහත සියලුම දත්තයන් නිලධාරීන්ගේ දෛනික, මාසික, අර්ධ වාර්ෂික, වාර්ෂික ප්‍රගති වාර්තා සියල්ල පරීක්ෂා කිරීමෙන් ලබාගෙන ඇති අතර ඒ අනුව ඉහත වගුව සකස්කර ඇත.

## 2.2 ඵලදායිතා ප්‍රවර්ධන වැඩසටහන

2021 වර්ෂයේදී ඵලදායිතා ප්‍රවර්ධන වැඩසටහන යටතේ සැලසුම් කරන ලද ක්‍රමෝපායන් අනුව කාර්යාලයීය කටයුතු ඉටු කිරීමට උපරිම උත්සාහයක් දරන ලදී.

**අභියෝග**

කොවිඩ්19 ගෝලීය වසංගතය තවම නිමාවට පත්ව නැති අතර එය නිමා වන දිනයක් පිළිබඳව පුරෝකථනය කිරීමට ද තවම හැකියාවක් නැත. එහි අතුරු ප්‍රතිඵලයක් ලෙස වර්තමානයේ රටේ උද්ගත වී ඇති විදේශ සංචිත හීන වීම ද රටේ ආර්ථිකයට විශාල බලපෑමක් එල්ල කර ඇත. එවන් වාතාවරණයක් යටතේ බදු හා ගාස්තු ලිහිල් කරමින් මධ්‍යම රජය මගින් ගනු ලබන ප්‍රතිපත්තිමය තීරණ හමුවේ ආදායම් ඉපැයීමේ ක්‍රියාවලියද දැඩි අභියෝගයකට ලක්ව ඇත. මෙම අභියෝගයට සාර්ථකව මුහුණදෙමින් රුපියල් මිලියන 2,096 ක ආදායමක් පළාත් සභාවට රැස්කර දීමට හැකිවීම දෙපාර්තමේන්තුව ලද ජයග්‍රහණයකි. එහිදී පළාතේ මහජනතාව, ව්‍යාපාරික ප්‍රජාව, ඉඩම් රේජිස්ටාර් කාර්යාල, ප්‍රාදේශීය ලේකම් කාර්යාල, රජයේ තක්සේරු දෙපාර්තමේන්තුව, මහජන බැංකුව, ලංකා බැංකුව හා පොලීසිය, අධිකරණ සහ වෙනත් රජයේ ආයතන මෙන්ම ගරු ආණ්ඩුකාරතුමා ඇතුළු කාර්යය මණ්ඩලයෙන්, ප්‍රධාන ලේකම්තුමා ඇතළු කාර්ය මණ්ඩලයෙන් ලැබුණු සහයෝගයද කෘතඥතා පූර්වකව සඳහන් කර සිටිමි.

රටේ වත්මන් ආර්ථික වාතාවරණය ද 2021 වසරේ දී ලද අත්දැකීම් ද සැලකිල්ලට ගනිමින් සකස් කරන ලද 2022 වර්ෂයේ ක්‍රියාකාරී සැලැස්ම මගින්, රජයේ සෞභාග්‍යයේ දැක්ම ප්‍රතිපත්ති වලට අනුගත වෙමින්, එමෙන්ම කොවිඩ්19 වසංගතය යටතේ නව සාමාන්‍යකරනයට සාර්ථකව මුහුණ දෙමින්, පළාතේ ජනතාව අපහසුතාවයට පත් නොවන සේ විවිධ ක්‍රමෝපායන් අනුගමනය කරමින් අපේක්ෂිත ආදායම් ඉලක්ක ළඟාකර ගනිමින් මධ්‍යම පළාත් සභාවේ ආදායම් වර්ධනයට ඉහළම දායකත්වයක් ලබාදීම අපගේ අරමුණයි.

**ස්තුතියි,**

(එච්. කේ. අජන්තා පෙරේරා)
පළාත් ආදායම් කොමසාරිස්
මධ්‍යම පළාත